00342

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව – හයවන මට්ටම

අවසාන පරීක්ෂණය - 2023/2024

කම්කරු නීතිය –LLU6715/LWU4323

කාලය – පැය 03

---

දිනය : 2025 මැයි 14 වේලාව : ප.ව 1.30 – ප.ව 4.30

---

මුළු ප්‍රශ්න ගණන – 08

ප්‍රශ්න <u>05 (පහකට) පමණක්</u> පිළිතුරු ලියන්න

**අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

1. "ස්වාමියා සහ සේවකයා සම්බන්ධයෙන් වන පොදු නීතිය, කාර්මික සබඳතාවන්ට අදාලව භාවිතයෙන් ඉවත් වී ඇති බව පොදු මතය වේ. සේවා කොන්දේසි පිලිබඳ ආරවුල් සාමාන්‍යයෙන් සේවා ගිවිසුමෙහි ප්‍රකාශිත හෝ ව්‍යංග නියමයන්ට අනුව අධිකරණය විසින් විසඳනු නොලැබේ... එබැවින්, කාර්මික සබඳතා ක්ෂේත්‍රයට නව ප්‍රවේශයක් ලබාදීමට නීතියට සිදුව ඇත."

   Lord Devlin in *United Engineering Workers Union v. Devanayagam* (1967)69NLR 289

   ඔබ ඉහත ප්‍රකාශයට එකඟ වන්නේද ? රාජ්‍ය නිර්බාධවාදී ප්‍රතිපත්තියේ සිට නූතන සුබසාධක රාජ්‍ය දක්වා සේවා ගිවිසුමෙහි ව්‍යාප්තිය කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 20)

2. (අ) සරත්, එස්. අයි.ඩී පාවහන් පුද්ගලික සමාගමේ (SID Shoes (Pvt) Ltd) නුගේගොඩ ශාඛාවේ කළමණාකරුවකු ලෙස සේවය කරයි. ඔහු 2020 ජනවාරි මස සේවයට බඳවා ගත්තේ වසරක සේවා ගිවිසුමකට යටත්වය. සමාගම ඔහුගේ සේවා ගිවිසුම කිහිප වතාවක් අලුත් කර ඇති බැවින්, සරත් අපේක්ෂා කළේ විශ්‍රාම යන තෙක් ඔහුට තම තනතුරෙහි දිගටම රැඳී සිට සේවය කිරීමට හැකිවනු ඇති බවයි. කෙසේ වෙතත්, වත්මන් ගිවිසුම්ගත කාලයෙන් පසු ඔහුගේ සේවය අවසන් කිරීමට එස්. අයි.ඩී පාවහන් (පුද්ගලික) සමාගම තීරණය කර ඇත.

   සරත්ට උපදෙස් දෙන්න. (ලකුණු 10)

   (ආ) සංචාරක සමයේ උච්චතම අවස්ථාවේදී, නුවරඑළියේ ග්‍රෑන්ඩ් හිල් හෝටලයේ කළමනාකාරින්වය සුරේෂ් ව සංචාරක මාර්ගෝපදේශකයෙකු ලෙස බඳවා ගත්තේය.

සංචාරකයින්ගේ පැමිණීම වැඩිවීම නිසා සුරේෂ් මාස දෙකක් අඛණ්ඩව වැඩ කළේය. කෙසේ වෙතත්, සංචාරක සමය අවසන් වී ඇති බැවින් ඔහුගේ සේවාවන් අවසන් කරන බව වාරය අවසානයේදී හෝටලය ඔහුට දැනුම් දුන්නේය.

සුරේෂ්ට උපදෙස් දෙන්න. (ලකුණු 10)

3. "අභිමතය නිසි පරිදි ක්‍රියාත්මක කරනු ඇතැයි යන විශ්වාශයට අනුගත වෙමින් ව්‍යවස්ථාදායකය තම ප්‍රඥාවෙන්, ප්‍රශ්නය විනිශ්චය සභාව වෙත යොමුකර ඇත. විනිශ්චය සභාවකින් සාධාරණ සහ යුක්ති සහගත නියෝගයක් ලබා දීමට නම්, ඒ සම්බන්ධව යම් මට්ටමක නම්‍යශීලීතාවයක් යෝග්‍ය බව සහ අවශ්‍ය බව මාගේ මතය වේ."

Wijethunga J in *Up Country Distributors (Pvt) Ltd v. Subasinghe* (1996) 2 SLR 330 ,335

ශ්‍රී ලංකාවේ 1950 අංක 43 දරණ (සංශෝධිත) කාර්මික ආරවුල් පනත යටතේ පිහිටුවා ඇති කම්කරු විනිශ්චය සභාවල බලතල සහ කර්තව්‍යයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වන්න . ඔබේ පිළිතුර අදාල අධිකාරයන් මඟින් තහවුරු කළ යුතුය. (ලකුණු 20)

4. (අ) රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් අතිරික්ත සේවකයින් 50 දෙනෙකු සේවයෙන් ඉවත් කරන බව බ්‍රයිට් ෂයින් ඇපරල් (පුද්) සමාගම නිවේදනය කර තිබේ. මෙමගින් බලපෑමට ලක් වූ සේවකයෙකු වන චන්ද්‍රනගේ සේවය ද කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව අවසන් කරන ලදී. ඔහුගේ සේවය අවසන් කිරීමට එරෙහිව ඔහුට ඇති ව්‍යවස්ථාපිත ආරක්ෂාවන් සහ ඔහුට ලබා ගත හැකි ප්‍රතිකර්ම පිළිබඳව නීති උපදෙස් ලබා ගැනීමට ඔහු දැන් අපේක්ෂා කරයි.

චන්ද්‍රනට උපදෙස් දෙන්න. (ලකුණු 10)

(ආ) 1971 අංක 45 දරන කම්කරුවන්ගේ සේවය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනත යටතේ ශ්‍රී ලංකාවේ කම්කරු කොමසාරිස්වරයාගේ භූමිකාව විවේචනාත්මකව විභාග කරන්න. සේවය අවසන් කිරීමේ අවස්ථාවන්හිදී සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කම්කරු කොමසාරිස්වරයාගේ මැදිහත්වීම උපකාරී වන්නේ කෙසේද ? (ලකුණු 10)

00342

5. රටේ ප්‍රමුඛතම රූපලාවන්‍ය නිෂ්පාදන නිෂ්පාදකයෙකු වන බියුටි සීක්‍රට්ස් (පුද්) සමාගමේ දැනට සේවකයින් 350 ක් සේවය කරයි. මෙම සේවකයින්ගෙන් 75% ක් පමණ "එක්සත් කම්කරු සංගමය" (UWU) ලෙස හැඳින්වෙන වෘත්තීය සමිතියක සාමාජිකයෝ වෙති. UWU හි ක්‍රියාකාරී සාමාජිකාවක් වන චතුරිකා, ඉදිරි පළාත් පාලන මැතිවරණය සඳහා අපේක්ෂකත්වය ප්‍රකාශයට පත් කළාය. ඇයගේ මැතිවරණ ව්‍යාපාරය සඳහා මූල්‍ය ආධාර ලබා දීමට UWU සාමාජිකයෝ ඒකමතිකව තීරණය කළහ. කෙසේ වෙතත්, බියුටි සීක්‍රට්ස් (පුද්) සමාගමේ කළමනාකාරිත්වය මෙම තීරණයට දැඩි ලෙස විරුද්ධ වූ අතර වෘත්තීය සමිතිය හරහා දේශපාලන කටයුතුවල යෙදීමෙන් වළකින ලෙස වෘත්තීය සමිති සාමාජිකයින්ට උපදෙස් දුන්නේය. කෙසේ වෙතත්, UWU සාමාජිකයෝ චතුරිකාට ඔවුන්ගේ සහයෝගය දිගටම ලබා දුන්හ. ඊට ප්‍රතිචාර වශයෙන්, දේශපාලන ව්‍යාපාරයට ක්‍රියාකාරීව සම්බන්ධ වූ චතුරිකා ඇතුළු සේවකයින් පස් දෙනෙකුගේ සේවය සමාගම විසින් අත්හිටුවන ලදී . මෙම අත්හිටුවීම සම්බන්ධයෙන් වෘත්තීය සමිතිය සමඟ සාකච්ඡා කිරීම කළමනාකාරිත්වය විසින් ප්‍රතික්ෂේප කළ බැවින්, UWU හි සියලුම සාමාජිකයෝ වැඩ වර්ජනයක් ප්‍රකාශයට පත් කිරීමට තීරණය කළහ. වැඩ වර්ජනය අතරතුර, කළමනාකාරිත්වයේ තීරණය කෙරෙහි ඔවුන්ගේ අප්‍රසාදය පළ කිරීම සඳහා ඔවුහු උද්ඝෝෂණයක් පැවැත්වූහ. උද්ඝෝෂණයේදී, උද්ඝෝෂකයෝ කිහිප දෙනෙක් සමාගමේ ආරක්ෂක පද්ධතිය, වාහනයක්, සහ නිෂ්පාදන යන්ත්‍ර දෙකක් ඇතුළු සමාගමේ දේපළවලට හානි සිදු කළහ. පසුව, හානියට වගකිව යුතු අයට එරෙහිව නීතිමය පියවර ගැනීමට අදහස් කරන බව සමාගම නිවේදනය කළේය.

ඉහත තත්ත්වය තුළ ඇති නීතිමය ගැටළු හඳුනාගෙන අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු නීතිය සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

6. ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය පාලනය කරන වත්මන් නීතිමය රාමුවේ ප්‍රමාණවත් භාවය විවේචනාත්මකව විග්‍රහ කරන්න. එය ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්ට කොතරම් දුරට අනුකූල වන්නේද? ළමා ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිසංස්කරණ තිබේ නම්, ඒවා මොනවාද? අදාළ නෛතික අධිකාරයන් දක්වමින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 20)

7. කොළඹ නගරය තුළ ප්‍රධාන ස්ථානවල අවන්හල් සහ බේකරි දාමයක් ව්‍යාප්ත කිරීමට සමන් සැලසුම් කරයි. ඔහු තම ව්‍යාපාරය සඳහා නව සේවකයින් බඳවා ගැනීමට සූදානම් වන අතර, ඔවුන්ගේ සේවා නියුක්තිය සම්බන්ධයෙන් වන කම්කරු නීති පිළිබඳව දැන ගැනීමට ඔහු අපේක්ෂා කරයි. විශේෂයෙන්ම , වැඩ කරන වේලාවන්, නිවාඩු දින, වේතන සම්බන්ධ රෙගුලාසි, සහ සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) වැනි සමාජ ආරක්ෂණ හිමිකම් පිළිබඳව නීති උපදෙස් ලබා ගැනීමට ඔහු අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ මෙම අංශ පාලනය කෙරෙන අදාළ ව්‍යවස්ථාවන් ඇසුරෙන් සමන් ට උපදෙස් දෙන්න.

( ලකුණු 20)

8. පහත සඳහන් ඕනෑම මාතෘකා <u>දෙකකට</u> අදාළ නීතිමය අංශ පැහැදිලි කරන්න.

(අ) සාමූහික ගිවිසුම්

(ආ) පරිවාසික සේවා නියුක්තිය

(ඇ) කාර්මික අධිකරණ

(ඈ) ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූලික සම්මුති

( ලකුණු 10X 2 =20)

- හිමිකම ඇවිරිණි -